1st Place Winner
National Productivity
Award 2020

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/2/9/OTH/(Vol. XVII) | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2026.02.25 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු/ සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දකුණු පළාත.

<u>අන්තර් පළාත් ස්ථාන මාරු යටතේ මධ්‍යම පළාතේ ආයතන තුළ පවතින සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු පිරවීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මා අමතන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක CPC/PSC/8/3/10-2 හා 2026.01.27 ලිපිය හා බැඳේ.

02. එමගින්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවය වෙත ස්ථාන මාරු අපේක්ෂිත සංවර්ධන නිලධාරීන් සිටී නම් මේ සමඟ අමුණා ඇති පුරප්පාඩු ලේඛනයේ සඳහන් ආයතනයක් නම් කර **එම නිලධාරීන් අනුප්‍රාප්තික නිලධාරියකු රහිතව නිදහස් කළ හැකි නම් පමණක්** දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත්‍රය සහ සෙසු ලේඛන යොමු කිරීමට ඔබ ආයතනය හා යටත් ආයතන වල සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

03. ඒ අනුව, මධ්‍යම පළාත් රාජ්‍ය සේවය වෙත අන්තර් පළාත් ස්ථාන මාරු ලබා ගැනීමට කැමති සංවර්ධන නිලධාරීන් සිටී නම් සම්පූර්ණ කරන ලද අන්තර් පළාත් ස්ථාන මාරු අයදුම්පත් හා අදාළ ලේඛන මා මගින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට ඔබ යටතේ පවතින සියළු ආයතන දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

කසුන් එස්.කේ.වැල්ලහේවා ,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු),
ප්‍රධාන ලේකම් වෙනුවට ,
දකුණු පළාත.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary – 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office – 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax – 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail – chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site – www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

E

මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தோட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

කාර්යාලය / காரியாலயம் / Office – 081-2213097
ලේකම් / செயலாளர் / Secretary – 081-2213096
සහකාර ලේකම් / உதவிச் செயலாளர் / Asst. Secretary – 081-5631121
ෆැක්ස් / பெக்ஸ் / Fax – 081-2213082

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/8/3/10-2
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2026-01-27

ප්‍රධාන ලේකම්,
බස්නාහිර/ දකුණ/ උතුර/ නැගෙනහිර/ වයඹ/ උතුරුමැද/ ඌව/සබරගමුව පළාත.

## අන්තර් පළාත් ස්ථාන මාරු යටතේ මධ්‍යම පළාතේ ආයතන තුළ පවතින සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු පිරවීම.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ආයතන තුළ සේවය කලත්, ඇතැම් ආයතන තුළ පවතින සංවර්ධන නිලධාරී පුරප්පාඩු සම්බන්ධයෙන් සලකා බලා, එම පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේදී දුෂ්කර සේවා ස්ථාන සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් අති දුෂ්කර සේවා ස්ථානවල වර්ෂ 3ක් ද, දුෂ්කර සේවා ස්ථානවල වර්ෂ 4ක් ද ලෙස සේවය කිරීමේ එකඟතාවය මත, අන්තර් පළාත් ස්ථාන මාරු යටතේ බඳවා ගැනීමට, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත මෙම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව ඔබ පළාත් සභාවේ සේවය කරන, මෙම ලිපිය සමඟ අමුණා ඇති පුරප්පාඩු ලේඛනයේ සඳහන් ආයතනයක් වෙත ස්ථාන මාරුවීමට කැමැත්තක් දක්වන සංවර්ධන නිලධාරීන් සිටින්නේ නම්, හා **එම නිලධාරීන් අනුප්‍රාප්තික නිලධරයකු රහිතව නිදහස් කල හැකි නම්, පමණක්** ස්ථාන මාරු අයදුම්පත්‍රය සෙසු ලිපි ලේඛන ද සමඟ ඔබ පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් මෙම කොමිෂන් සභා කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙසට, ඔබ පළාත් සභාවේ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී "ස්ථාන මාරු අපේක්ෂිත ආයතනය" ලෙස, මේ සමඟ අමුණා ඇති ලේඛනයේ සඳහන් සංවර්ධන නිලධාරී පුරප්පාඩු පවතින සේවා ස්ථානයක් සඳහන් කල යුතු අතර, එසේ නොවන සේවා ස්ථානයක් සඳහන් කර ඇත්නම් එම අයදුම්පත්‍ර සම්බන්ධ ඉදිරි කටයුතු සිදු නොකරන බව ද අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

සුජානි ආර්. විජේතුංග,
ලේකම් (රා.ආ),
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත -

1. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කා.දැ.පි. හා අ.ක.ස.
බස්නාහිර/දකුණ/ උතුර/ නැගෙනහිර/ වයඹ/ උතුරුමැද/ ඌව/ සබරගමුව පළාත.

ඇමුණුම

## අන්තර් පළාත් ස්ථාන මාරු අයදුම් කල හැකි - පුරප්පාඩු ලේඛණය

| අනු අංකය | ආයතනයේ නම | සංවර්ධන නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කර්මාන්ත අමාත්‍යාංශය - නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2 |
| 2 | කර්මාන්ත අමාත්‍යාංශය - නිල්දණ්ඩාහින්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2 |
| 3 | කර්මාන්ත අමාත්‍යාංශය - තලවකැලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2 |
| 4 | කර්මාන්ත අමාත්‍යාංශය - මතුරට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2 |
| 5 | කර්මාන්ත අමාත්‍යාංශය - කොත්මලේ බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2 |
| 6 | කර්මාන්ත අමාත්‍යාංශය - කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 7 | කර්මාන්ත අමාත්‍යාංශය - වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 8 | කර්මාන්ත අමාත්‍යාංශය - නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 9 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - තලවකැලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 10 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - නිල්දණ්ඩාහින්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 11 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 12 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය හා ගොවිපොල - ගල්පාලම | 1 |
| 13 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - පූඩ්ළුඔය | 1 |
| 14 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - වලපනේ | 2 |
| 15 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - නුවරඑළිය | 2 |
| 16 | ආයුර්වේද දෙපාර්තමේන්තුව - නිල්දණ්ඩාහින්න ආයුර්වේද රෝහල | 2 |
| 17 | ආයුර්වේද දෙපාර්තමේන්තුව - නුවරඑළිය ආයුර්වේද රෝහල | 2 |
| 18 | ආයුර්වේදදෙපාර්තමේන්තුව - කොත්මලේ ආයුර්වේද රෝහල | 2 |
| 19 | සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - හැටන් පරිවාස කාර්යාලය | 1 |
| 20 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 3 |
| 21 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - දිස්ත්‍රික් මූලික රෝහල - දික්ඔය | 1 |
| 22 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - දිස්ත්‍රික් ළය චිකිත්සාගාරය -නුවරඑළිය | 1 |
| 23 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - ප්‍රාදේශීය රෝහල - ආගරපතන | 1 |
| 24 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - ප්‍රාදේශීය රෝහල - ඩයගම | 1 |
| 25 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - ප්‍රාදේශීය රෝහල - ගිනිගත්හේන | 1 |
| 26 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - ප්‍රාදේශීය රෝහල - ගෝනගන්තැන්න | 1 |
| 27 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - ප්‍රාදේශීය රෝහල - ගෝනපිටිය | 1 |
| 28 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - ප්‍රාදේශීය රෝහල - හයිෆොරස්ට් | 1 |
| 29 | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - කොත්මලේ | 2 |

| අනු අංකය | ආයතනයේ නම | සංවර්ධන නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 30 | නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව, | 11 |
| 31 | කොටගල ප්‍රාදේශීය සභාව | 11 |
| 32 | ආගරපතන ප්‍රාදේශීය සභාව | 11 |
| 33 | මස්කෙළිය ප්‍රාදේශීය සභාව | 11 |
| 34 | තලවාකැලේ ලිඳුල නගර සභාව | 9 |
| 35 | වලපනේ ප්‍රාදේශීය සභාව | 5 |
| 36 | නුවරඑළිය ප්‍රාදේශීය සභාව | 9 |
| 37 | හැටන් දික්ඔය නගර සභාව | 7 |
| 38 | නුවරඑළිය මහා නගර සභාව | 6 |
| 39 | කොත්මලේ ප්‍රාදේශීය සභාව | 6 |
| 40 | අඹගමුව ප්‍රාදේශීය සභාව | 6 |
| 41 | කලාප අධ්‍යාපන කාර්යාලය, නුවරඑළිය | 7 |
| 42 | කර්මාන්ත අමාත්‍යාංශය - ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2 |
| 43 | කර්මාන්ත අමාත්‍යාංශය - යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 44 | කර්මාන්ත අමාත්‍යාංශය - අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 45 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 46 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 47 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 48 | ආයුර්වේද දෙපාර්තමේන්තුව - උතුරු මාතලේ ආයුර්වේද රෝහල | 1 |
| 49 | ආයුර්වේද දෙපාර්තමේන්තුව - තැන්න ආයුර්වේද රෝහල | 1 |
| 50 | ආයුර්වේද දෙපාර්තමේන්තුව - ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - නාඋල | 1 |
| 51 | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ලග්ගල පශු වෛද්‍ය කාර්යාලය | 1 |
| 52 | මාතලේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - ප්‍රාදේශීය රෝහල - හත්තොට අමුණ | 1 |
| 53 | කලාප අධ්‍යාපන කාර්යාලය - විල්ගමුව | 1 |
| 54 | කලාප අධ්‍යාපන කාර්යාලය - ගලේවෙල | 1 |
| 55 | විල්ගමුව ප්‍රාදේශීය සභාව | 5 |
| 56 | ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව | 2 |
| 57 | පල්ලේපොල ප්‍රාදේශීය සභාව | 3 |
| 58 | දඹුල්ල ප්‍රාදේශීය සභාව | 2 |
| 59 | නාඋල ප්‍රාදේශීය සභාව | 2 |
| 60 | රත්තොට ප්‍රාදේශීය සභාව | 3 |
| 61 | මාතලේ ප්‍රාදේශීය සභාව | 1 |
| 62 | කර්මාන්ත අමාත්‍යාංශය - මිණිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 63 | කර්මාන්ත අමාත්‍යාංශය - උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1 |
| 64 | ආයුර්වේද දෙපාර්තමේන්තුව - ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - උඩුදුම්බර | 1 |
| 65 | ආයුර්වේද දෙපාර්තමේන්තුව - ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - ගඟඉහළකෝරළේ | 1 |
| 66 | ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 1 |
| 67 | පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව | 1 |
| | එකතුව | **179** |